මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය
--------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 09 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින මහා නගර සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-------------------------------------------------------------------

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සභාව මගින් මිළදී ගෙන තිබුණු රු.209,357 ක් වූ වත්කම් 8 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අතැති තොගය රු.9,748,721 ක් වුවද උපලේඛන අනුව වටිනාකම රු.5,251,786 ක් වූයෙන්රු.4,496,935 ක් වැඩියෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඇ) 2013 ඔක්තෝබර් 22 දින වෙන්දේසි කර වත්කම් වලින් ඉවත් කරන ලද භාණ්ඩ 20 කට අයත් ඒකක 195 ක ගත්මිල ස්ථාවර වත්කම් ගිණුම බැර කොට ප්‍රාග්ධනෙ යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම හර කළයුතු වුවද එය සිදුව නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සේවක ණය ලේඛනයට අනුව වැඩිපුර ලැබීම් රු.19,697 ක් වුවද එකී මුදල ජංගම බැරකම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ස්ථිර කරන ලද අනියම් හා ආදේශක සේවකයින් 22 දෙනෙකුගේ සේවක අරමුදලේ දායක මුදල වෙනුවෙන් ගෙවා ඇති සභා දායකය වූ රු.2,658,411 ක මුදල සභාව වෙත ආපසු ලැබිය යුතුව තිබුණද එකී මුදල ගිණුම්වල ජංගම වත්කම් යටතේ පෙන්වා නොතිබුණි.

(ඊ) සභාව විසින් ඉකුත් වර්ෂයේ ගබඩාවෙන් නිකුත් කරන ලද රු.277,550 ක් වූ නිකුත් නියෝග 08 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ සභාවට මිලටගෙන තිබුණු රු.2,680,000 ක වටිනාකම වූ ට්‍රයිසිකල් 10 ක වටිනාකම මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 ගිණුම්වලින් අත්හැරීම්

------------------------

2011 ජුනි 05 දින පැවැති සභා රැස්වීමේදී මාතර මෝටර් සර්විස් හා මෝටර් වර්ක්ස් ආයතනයට ගෙවිය යුතු බවට අනුමත කළ රු.255,290 ක වාහන අළුත්වැඩියා වියදම සමාලෝචිත වර්ෂයේදී ගෙවා නොතිබුණද එකී වටිනාකම වෙනුවෙන් ණයහිමියන් ප්‍රතිපාදනය කර නොතිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම

---------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 07 කට අදාල වටිනාකම රු.51,918,049 ක් වූ අතර ඉදිරිපත් කර තිබූ තොරතුරු හා උපලේඛන අනුව එකී ගිණුම් වල වටිනාකම රු.43,397,144 ක් වූයෙන් වෙනස රු.8,520,905 ක් විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.147,664,731 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.199,546,027 ක් විය.

(ඇ) රු.7,705,655 ක් වූ ගිණුම් ශේෂ 07 ක් නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

රු.284,689,953ක් වටිනා ගිණුම් විෂයයන් 09 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.7 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

මහා නගර සභා ආඥා පනත
--------------------------------

(i) 171 වගන්තිය — මහා නගර සභාවට අයවිය යුතු සියළු ආදායම් අයකර ගැනීමට විධිමත්ව කටයුතු කර නොතිබුණි.

(ii) 218 වගන්තිය — නගරාධිපතිවරයා විසින් එක් එක් මුදල් වර්ෂය තුලදී මහ නගර සභා අරමුදලට එකතු වූ ලැබීම් වල සහ අරමුදලින් කළ ගෙවීම්වල ස්වභාවය හා ප්‍රමාණය දැක්වෙන ප්‍රකාශයන්ද පිළියෙල කර සභාව වෙත ඉදිරිපත් කිරීම හා අදාල විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සිදුව නොතිබුණි

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ 2013 දෙසම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,030,836 ක් වූ අතර, එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,328,218 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 38,311 | 32,487 | 43,732 |
| බදු කුලී | 14.319 | 16,994 | 11,138 |
| බලපත්‍ර ගාස්තු | 11,980 | 8,174 | 914 |
| වෙනත් ආදායම් | 184,453 | 100,583 | 54,698 |

2.2.2 වරිපනම් බදු
--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ ගෘහ, වාණිජ, රාජ්‍ය ආයතන, ආගමික ස්ථාන, කාර්මික අධ්‍යාපන ආයතන වලින් සමන්විත පාරිභෝගික ස්ථාන 17313 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි වරිපනම් බදු මුදල රු.43,732,995 ක් විය. හිඟය වැඩිවීමේ ප්‍රතිශතය සියයට 23.7 ක් විය. තවද 2012 හා 2013 වර්ෂවල දේපල තහනම් නියෝග සකස් කිරීම,

නියෝග අත්සන් කිරීම, දේපල තහනම් නිලධාරීන්ට වරෙන්තු භාරදීම සිදුව නොතිබුණෙන් හිඟහිටි මුදල එම ප්‍රමාණයට වැඩිවී තිබුණි.

(ආ) එක් එක් වර්ෂයේ හිඟ මුදල, බිල්කල මුදලින් සමාලෝචිත වර්ෂයේ අයවූ මුදල හා හිඟ හිටි මුදල ගණනය කළහැකි ආකාරයෙන් පරිගනක පැකේජය සකස්ව නොතිබුණෙන් බදු අයවීමේ ප්‍රගතිය ඇගයීමට නොහැකි විය.

(ඇ) රු.50,000 කට වැඩියෙන් හිඟහිටව පවතින රාජ්‍ය ආයතන 17 කින් හා වාණිජ ආයතන 22 කින් රු.4,130,220 ක මුදලක් ලැබිය යුතු වූ අතර එකී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වරිපනම් කොට්ඨාශ 15 හි හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා එක් එක් කාර්තුවේදී මහා නගර සභා ආඥා පනතේ 252(1)(ආ) ඡේදය පරිදි ක්ෂේත්‍රයේ බදු එකතු කරන්නන් 14 දෙනෙකු වෙත පහත සඳහන් පරිදි පවරා ඇතත් බදු අයකර ගැනීමේ ප්‍රගතිය සතුටුදායක නොවිය.

| කාර්තුව | අයකිරීමට භාරදුන් මුදල | අයකරදුන් මුදල | අයවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| --------- | -------------------- | ----------------- | ---------------------- |
| | රු. | රු. | % |
| පළමු කාර්තුව | 16,089,268 | 909,952 | 5.6 |
| දෙවන කාර්තුව | 28,454,218 | නැත | - |
| තෙවන කාර්තුව | 30,427,402 | 710,883 | 2.3 |
| සිව්වන කාර්තුව | 35,580,461 | 198,649 | 0.55 |
| | | | ------ |
| | | | 2.11 |
| | | | === |

තවද සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුවේ සහ දෙවන කාර්තුවේදී කොට්ඨාශ 6 ක හිඟහිටි වරිපනම් බදු අයකර ගැනීම සඳහා උපලේඛන භාරදී නොතිබුණි.

(ඉ) සභා බල ප්‍රදේශයේ නව ගොඩනැගිලි ඉදිවී සංවර්ධනය වී ඇතත්, එම දේපල වලින් වරිපනම් බදු අයකර ගැනීමට දේපල තක්සේරු කරවා ගැනීමේ ප්‍රමාදයන් විය. ගොඩනැගිලි ඉදිවී සංවර්ධනය වීමට සමගාමීව කැලි කසල බැහැර වීමද වැඩි වන අතර ඒවා බැහැර කිරීමටද සභාවට විශාල පිරිවැයක් දැරීමට සිදුව ඇත. එහෙත් ඊට සමගාමීව වරිපනම් බදු ආදායම් වැඩිකර ගැනීමට සභාවේ අවධානය යොමුව නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.52,478,134 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂ ගණනාවකට පෙර විශ්‍රාම ගිය, මිය ගිය, සේවය අතහැර ගිය, සේවකයින්ගෙන් උත්සව අත්තිකාරම්, ආපදා ණය, විශේෂ හා ගංවතුර අත්තිකාරම් සඳහා ලබාදුන් රු.331,219 ක මුදලක් අයවීමට තිබුණි.
මෙම සේවකයින් විශ්‍රාම යන අවස්ථාවේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිතයෙන් හෝ මරණ පාරිතෝෂිතයෙන් ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ණය සඳහා කාල විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කිරීමටද අපොහොසත් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැටුප් රහිත හා අඩවැටුප් සහිත නිවාඩු ලබාගත් සේවකයින් 96 දෙනෙකුගෙන් රු.1,587,558 ක මුදලක් අයකර ගත යුතුව තිබුණද එකී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

2013 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 වගන්තිය පරිදි දේපල ණය සඳහා බංකු පොලී අනුපාත හා නිලධාරියාගෙන් අයකරන සියයට 4 ක පොලී අනුපාතය අතර වෙනස රජය විසින් දරනු ලබන අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට ලැබිය යුතු රු.1,391,714 ක මුදල ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

3.3 ඉඩම් විකිණීම මත බදු පැනවීම

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

මහා නගර සහා ආඥා පනතේ 247(ඉ) උප වගන්තිය පරිදි සභා බල ප්‍රදේශයේ පිහිටි යම් ඉඩමක් විකුණනු ලැබුවහොත් එකී විකුණුමෙන් ලබාගන්නා මුදලින් සියයට 1 ක බද්දක් අයකර ගැනීමට සභා සම්මත කරගෙන තිබුණි. ඒ අනුව සභාව අයකල සියයට 1 ක බදු ආදායම අයවූ බවට තහවුරු කෙරෙන ආදායම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණෙන් සහා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි වලින් නියමිත පරිදි බදු අයවූයේද යන්න තහවුරු කරගත නොහැකි විය.

3.4 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 09 | 04 | 05 | |
| ද්විතියික | 138 | 92 | 46 | |
| ප්‍රාථමික | 343 | 320 | 23 | |
| අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් | - | 214 | | 214 |
| | 490 | 630 | 74 | 214 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.94,399,000 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබුණද වර්ෂයේ වැටුප් හා සහික දීමනා ලෙස රු.103,555,953 මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු. 9,156,953 ක අතිරේක වැය බරක් වී තිබුණි.

3.5 සනඅපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

නගර සභාවට අයත් කොටවිල කන්දකැටියවත්ත ඉඩමේ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ලබාදී ඇති ප්‍රතිපාදන මුදල රු.13,513,230 ක් වන අතර වියදම රු.6,164,145 ක් වූයෙන් වැය නොකර ඉතිරි වූ මුදල රු.7,349,085 ක් විය.

(ii) දිනකට පොහොර ටොන් 3.5 ක් පමණ නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබියදී අලෙවි කිරීමේ ගැටළුව නිසා නිෂ්පාදනය සීමාකර ඇති අතර අලෙවි කිරීමේ මාර්ග වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව අයවැයගත ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණ වූයෙන් සභාවේ අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය